**ලක්ෂ්මන් කදිර්ගාමර් ජාත්‍යන්තර සම්බන්ධතා හා ක්‍රමෝපාය අධ්‍යයන ආයතනය - 2022**

---

## 1. මූල්‍ය ප්‍රකාශන

### 1.1 තත්ත්වාගණනය කළ මතය

ලක්ෂ්මන් කදිර්ගාමර් ජාත්‍යන්තර සම්බන්ධතා හා ක්‍රමෝපාය අධ්‍යයන ආයතනයේ ("ආයතනය") 2022 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය, හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන්, සාරාංශගත වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්තිවලින් සමන්විත 2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ සහ 1971 අංක 38 දරන මුදල් පනතේ විධිවිධාන ප්‍රකාරව මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත්කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

මෙම වාර්තාවේ 1.5 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, ආයතනයේ මූල්‍ය ප්‍රකාශන තුළින් 2022 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහ සත්‍ය හා සාධාරණ ලෙස දැක්වෙන අයුරින් ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඇති බව මා දරන්නාවූ මතය වේ.

### 1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

මෙම වාර්තාවේ 1.5 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

### 1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී, ආයතනය අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරීත්වය ආයතනය ඇවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා ආයතනයේ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීමද කළමනාකරණයේ වගකීමකි.
ආයතනයේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධව පරීක්ෂා කිරීමේ වගකීම, සම්බන්ධ පාර්ශව විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උප වගන්තිය ප්‍රකාරව, ආයතනයේ වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

### 1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්වය සහ වෘත්තීය සැකමුසු බවින් යුතුව ක්‍රියාකරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාචෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මගහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මගහැරීමෙන් වැනි හේතු නිසාවන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවූවද, අවස්ථාචෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය, ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.

- සිද්ධීන් හෝ තත්ත්වයන් හේතුවෙන් ආයතනයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් තිබේද යන්න සම්බන්ධයෙන් ලබාගත් විගණන සාක්ෂි මත පදනම්ව ගිණුම්කරණය සඳහා ආයතනයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ පදනම යොදා ගැනීමේ අදාළත්වය තීරණය කරන ලදී. ප්‍රමාණවත් අවිනිශ්චිතතාවයක් ඇති බවට මා නිගමනය කරන්නේ නම් මූල්‍ය ප්‍රකාශනවල ඒ සම්බන්ධයෙන් වූ හෙළිදරව් කිරීම්වලට මාගේ විගණන වාර්තාවේ අවධානය යොමු කළ යුතු අතර, එම හෙළිදරව්කිරීම් ප්‍රමාණවත් නොවන්නේ නම් මාගේ මතය විකරණය කළ යුතුය. කෙසේ වුවද, අනාගත සිද්ධීන් හෝ තත්ත්වයන් මත අඛණ්ඩ පැවැත්ම අවසන් වීමට හැකිය.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගණුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත්වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථයද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කළ ආයතනයේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකිවන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේ ද යන බව,

- යම් අදාළ ලිඛිත නීතියකට හෝ ආයතනයේ පාලක මණ්ඩලය විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව, ආයතනය ක්‍රියාකර ඇති බව,

- සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව,

- සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නිතීරීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව,

## 1.5 මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම සම්බන්ධයෙන් වූ විගණන නිරීක්ෂණ

### 1.5.1. ගිණුම්කරණ අඩුපාඩු

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| සමාලෝචිත වර්ෂයේදී පුහුණු අංශය මගින් රු.169,500කට මිලටගත් කාර්යාල උපකරණවල වර්ෂය අවසානයේදී ශුද්ධ වටිනාකම රු.152,550ක් වියයුතු වුවත් එම අගය මූල්‍ය ප්‍රකාශනවල දක්වා නොතිබුණි. | නිවැරදි කිරීමට සටහන් කර ගතිමි. | නිවැරදි ගණනය කිරීම් මූල්‍ය ප්‍රකාශනවල දැක්විය යුතුය. |

### 1.5.2 විගණනය සඳහා ලිඛිත සාක්ෂි නොවීම

| විෂයය | මුදල රු. (මිලියන) | නොසැපයූ විගණන සාක්ෂි | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|---|
| ක්ෂය වටිනාකම | 1.7 | වත්කම් මිලදී ගත් දින හා ඒවායේ පිරිවැය සහිත උප ලේඛන හා ස්ථාවර වත්කම් ලේඛනය | මේ වන විට ස්ථාවර වත්කම් ලේඛන යාවත්කාලීන කිරීම ආරම්භ කර ඇත. | ක්ෂය වටිනාකමෙහි නිවැරදිතාවය තහවුරු කරගැනීමට අදාළ ලේඛන විගණනයට ඉදිරිපත් කළ යුතුය. |

**1.6 නීති, රීති, රෙගුලාසි සහ කළමනාකරණ තීරණ ආදියට අනුකූල නොවීම**

| නීති, රීති, රෙගුලාසි ආදියට යොමුව | අනුකූල නොවීම | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) 2006 අංක 32 දරන උපාය මාර්ග අධ්‍යයනය පිළිබඳ ශ්‍රී ලංකා ආයතනය (සංශෝධන) පනත | | | |
| (i) 10 (අ) වගන්තිය | ආයතනයේ කළමනාකරණ මණ්ඩලය විසින් පුද්ගලයින් පස්දෙනෙකුගෙන් සමන්විත ජාත්‍යන්තර උපදේශක සභාවක් පත්කළ යුතු වුවත් එවැනි උපදේශක සභාවක් පත්කර නොතිබුණි. | ජාත්‍යන්තර උපදේශක සභාවක් පත්කිරීම වෙනුවට සමාලෝචන මණ්ඩලයක් පත්කර ඇත. කළමනාකරණ මණ්ඩලය මෙම නම්කරන ලද දේශීය සමාජිකයන් සඳහා අනුමැතිය ලබා දී ඇති අතර මීට අමතරව විදේශීය සාමාජිකයන් ද මෙම සමාලෝචන මණ්ඩලයට ඇතුළත් කළ යුතු බවට තීරණයක් ගෙන ඇති අතර ඒ සම්බන්ධයෙන් කටයුතු කරගෙන යන බව. | පනතේ විධිවිධාන ප්‍රකාරව ජාත්‍යන්තර උපදේශක සභාවක් පත්කළ යුතුය. |
| (ii) 10 ඉ (1) වගන්තිය හා 10 ඉ (2) වගන්තිය | පනත ක්‍රියාත්මක වන දිනයේ සිට එනම් 2006 සැප්තැම්බර් 29 දින සිට බණ්ඩාරනායක ජාත්‍යන්තර තානාපති පුහුණු ආයතනය, මෙම ආයතනය වෙත පවරා ගත යුතු අතර එය ආයතනයේ ඒකකයක් වශයෙන් පුහුණු වැඩසටහන් හා වෙනත් අධ්‍යයන පාඨමාලා පැවැත්විය යුතුය. තවද එහි සේවයේ නියුක්තව සිටි නිලධරයන් හා සේවකයින්ද, ආයතනයේ නිලධරයන් හා සේවකයින් ලෙස සැලකිය යුතුය. එසේ වුවත් එම අවශ්‍යතා ඉටුකර නොතිබුණි. | 2020 වසර දක්වා ආයතනය විසින් පාඨමාලා පැවැත්වීමෙන් උපයා ගත් මුදල් මඟින් එහි සියලු වියහියදම් සිදුකොට ඇත. 2020 වසරේ සිට ආයතනයේ කුලිය ගෙවීම සඳහා ප්‍රතිපාදන වෙන් කිරීමට විදේශ කටයුතු අමාත්‍යාංශය ප්‍රතිපත්තිමය තීරණයක් ගෙන ඇත. | පනතේ විධිවිධාන ප්‍රකාරව කටයුතු කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| (iii) 10 ඉ (2) (i) වගන්තිය | පනත ක්‍රියාත්මක වන දිනයට පෙර බණ්ඩාරනායක ජාත්‍යන්තර තානාපති පුහුණු ආයතනය විසින් පවත්වාගෙන යන යම් ගිණුමක බැරට තිබූ සියලු මුදල් ආයතනයේ අරමුදලට මාරු කළ යුතු වුවත්, එසේ කර නොතිබුණි. | පුහුණු ආයතනය විසින් පවත්වාගෙන යන ගිණුම් වල ඇති මුදල් ආයතනය විසින් ස්වඋත්සාහයෙන් උපයාගත් බැවින් හා එහි වියදම් සඳහා රජයෙන් ප්‍රතිපාදන නොලැබෙන බැවින් එම මුදල් වෙනත් ගිණුමක් වෙත මාරු කිරීමට කටයුතු කර නැත. | පනතේ විධිවිධාන ප්‍රකාරව කටයුතු කළ යුතුය. |
| (ආ) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය. | | | |
| (i) මුදල් රෙගුලාසි 395 (ඌ) | බැංකු සැසඳුම් ප්‍රකාශ පිළියෙල කල යුත්තේ එකතුවන මුදල් බැංකුවේ තැන්පත් කිරීම, චෙක්පත් ලිවීම හෝ මුදල් පොත පවත්වා ගැනීම ගැන කිසිම සම්බන්ධයක් නැති නිලධාරියෙකු හෝ නිලධාරින් විසින් වුවත් ආයතනයේ මෙම සියලු කාර්යයන් එකම නිලධාරිනියක් විසින් සිදුකර තිබුණි. | කාර්ය මණ්ඩල තනතුරු සඳහා කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ අනුමැතිය ලද පසු තනතුරු සඳහා බඳවාගෙන කාර්යය පැවරීමට කටයුතු කරන බව. | මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කළ යුතුය. |
| (ii) මුදල් රෙගුලාසි 756 | ඉන්වෙන්ට්‍රිගත කර නොතිබූ භාණ්ඩ අයිතම 149ක් හා පුස්තකාලයේ පොත් සමාලෝචිත වර්ෂයේදී සමීක්ෂණය කර නොතිබුණි. | තවදුරටත් භාවිතයට ගත හැකි මෙම භාණ්ඩ බඩු වට්ටෝරු ලේඛනයට ඇතුළත් කිරීමට හා මෙම වසරේදී පුස්තකාලයේ පොත් සමීක්ෂණය කර වාර්තා කරන බව. | මුදල් රෙගුලාසි ප්‍රකාරව සියලුම භාණ්ඩ සමීක්ෂණය කළ යුතුය. |
| (ඇ) 2009 මැයි 26 දිනැති අංක 39 දරන කළමනාකරණ සේවා චක්‍රලේඛයේ (01) ඡේදය | සංස්ථා හා ව්‍යවස්ථාපිත මණ්ඩලවලට අදාළ පනත් මඟින් ආයතනයේ සේවක මණ්ඩලය වෙත වැටුප් හා දීමනා නියම කිරීම සඳහා ප්‍රතිපාදන සලසා තිබුණද, වැටුප් හා සේවක සංඛ්‍යා කමිටු නිර්දේශය හා කළමනාකරණ සේවා දෙපාර්තමේන්තු අනුමැතිය | කළමණාකරණ සේවා දෙපාර්තමේන්තුවේ අනුමැතිය ලබා ගැනීම සඳහා අවශ්‍ය කෙරෙන විස්තර ඉදිරි සතිය තුළ ඉදිරිපත් කරන බව. | චක්‍රලේඛ විධිවිධාන ප්‍රකාරව කටයුතු කළ යුතුය. |

| | | | | |
|---|---|---|---|---|
| | | රහිතව විෂයභාර අමාත්‍යවරයා හෝ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් එවැනි ප්‍රතිපාදන අනුමත කිරීමෙන් වැළකී සිටිය යුතුය. එසේ වුවද අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතිය මත විදේශ අමාත්‍යාංශයෙන් ආයතනය වෙත අනුයුක්ත කළ නිලධාරීන් 04 දෙනෙකු සඳහා එකතුව රු.857,903ක් සමාලෝචිත වර්ෂයේදී දීමනා ලෙස ගෙවා තිබුණි. | | |
| (ඇ) | 2016 අප්‍රේල් 25 දිනැති අංක 02/2016 හා 2016 ඔක්තෝබර් 21 දිනැති අංක 02/2016(i) දරන කළමණාකරණ සේවා චක්‍රලේඛය | ආයතනයේ ජ්‍යෝෂ්ඨ කළමණාකරණ මට්ටම සඳහා සේවා කාණ්ඩ 04 ක් යටතේ හා මධ්‍යම කළමණාකරණ මට්ටම සඳහා සේවා කාණ්ඩ 03 ක් යටතේ ඒ ඒ තනතුරු පිහිටුවිය යුතු අවම හා උපරිම වැටුප් කේත 04 ක් දක්වා තිබුණද ඒ යටතේ හඳුනා නොගෙන ආයතනයේ අධ්‍යක්ෂ ජනරාල් (පුහුණු) හා අධ්‍යක්ෂ (පාලන හා මූල්‍ය) වෙත පිළිවෙළින් රු.2,160,000 ක් හා රු.1,800,000 ක් වැටුප් වශයෙන් සමාලෝචිත වර්ෂයේදී අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතියෙන් ගෙවා තිබුණි. | -එම- | චක්‍රලේඛ විධිවිධාන ප්‍රකාරව කටයුතු කළ යුතුය. |
| (ඉ) | 2021 නොවැම්බර් 16 දිනැති අංක 01/2021 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛය | | | |
| | (i) මෙහෙයුම් අත්පොත | | | |
| | • 3.2.1වගන්තිය | ආයතනයට පැවතිය යුතු තනතුරු ප්‍රමාණය, බඳවා ගැනීමේ පටිපාටි, වැටුප් | -එම- | -එම- |

| | | | |
|---|---|---|---|
| | ව්‍යුහය හා දීමනා සඳහා කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ අනුමැතිය ලබාගත යුතු වුවත් ඒ අනුව කටයුතු කර නොතිබුණි. | | |
| • 6.6 වගන්තිය | (i) ගිණුම් වර්ෂය අවසන් වී මාස 02 ඇතුළත සහතික කළ මූල්‍ය ප්‍රකාශන විගණකාධිපතිවරයා වෙත ඉදිරිපත් කළ යුතු වුවත්, සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන මාස තුනක් සහ දින 14ක් ප්‍රමාද වී 2023 ජුනි 14 දින ඉදිරිපත් කර තිබුණි. | මින් ඉදිරියට මූල්‍ය ප්‍රකාශන සඳහා කළමණාකරණ මණ්ඩල අනුමැතිය ලබාගැනිම සඳහා රැස්වීම් නිසි කාලවලදී පවත්වා ගැනීමට කටයුතු කරන බව. | චක්‍රලේඛ විධිවිධාන ප්‍රකාරව මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කළ යුතුය. |
| | (ii) යම් වර්ෂයකට අදාළ වාර්ෂික වාර්තා මුදල් වර්ෂය අවසන්වී මාස පහකට පෙර පාර්ලිමේන්තුවේ සභාගත කළ යුතු වුවත් ආයතනය 2007 වර්ෂයේ සිට වාර්ෂික වාර්තා සභාගත කර නොතිබුණි. | 2007 සිට 2015 දක්වා මූල්‍ය ප්‍රකාශන අඩංගු වාර්තාවක් හා 2016 සිට 2021 දක්වා වාර්ෂික වාර්තා ඉදිරිපත් කිරිම සඳහා කැබිනට් පත්‍රිකාවක් පිළියෙල කර ඇත. | -එම - |
| (ii) යහපාලනය පිළිබඳ මාර්ගෝපදේශය 2.3 වගන්තිය | වාර්ෂික අයවැය ලේඛනය හා ක්‍රියාකාරී සැලැස්ම සමඟ ආයතනයේ අරමුණු ඉටුකරගැනීමට අදාළව සකස්කරන ලද උපාය මාර්ගීක සැලස්ම රේඛීය අමාත්‍යාංශයේ ලේකම් මඟින් රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තුමේන්තුවට හා ජාතික අයවැය දෙපාර්තුමේන්තුවට ඉදිරිපත් කළයුතු වුවත් ඒ අනුව කටයුතු කර නොතිබුණි. | ක්‍රියාකාරී සැළැස්ම මේ සමඟ අමුණා ඇත. | චක්‍රලේඛ විධිවිධාන ප්‍රකාරව ක්‍රියාකාරී සැලස්මක් පිළියෙල කර අදාළ ආයතනවලට ඉදිරිපත් කළ යුතුය. |

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵල

සමාලෝචිත වර්ෂයේ මෙහෙයුම් ප්‍රතිඵලය රු.2,900,074 ක අතිරික්තයක් වූ අතර ඊට ප්‍රතිරූපිව ඉකුත් වර්ෂයේ ඌනතාවය රු. 1,075,825 ක් විය. ඒ අනුව මූල්‍ය ප්‍රතිඵලයෙහි රු.3,975,899 ක වර්ධනයක් නිරීක්ෂණය විය. කාර්ය මණ්ඩල වියදම් හා පරිභෝජන ද්‍රව්‍ය සැපයුම් වියදම් රු.11,585,055 කින් වැඩි වුවද ඊට සාපේක්ෂව සමාලෝචිත වර්ෂයේ ආදායම රු.15,236,301 කින් වැඩි වීම මෙම වර්ධනයට ප්‍රධාන වශයෙන් හේතු වී තිබුණි.

## 3. මෙහෙයුම් සමාලෝචනය

### 3.1 කළමනාකරණ අකාර්යක්ෂමතා

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 2006 පෙබරවාරි 23 දිනැති අංක අමප003/214/0202/06 දරන අමාත්‍ය මණ්ඩල තීරණයේ (අ) වගන්තිය පරිදි කොළඹ 07, හෝටන් පෙදෙස, අංක 24 ස්ථානයේ තිබෙන දේපළවල හිමිකාරීත්වය ආයතනය වෙත පවරා ගෙන නොතිබුණි. | දේපළ පවරා ගැනීම සම්බන්ධයෙන් කළමණාකරණ මණ්ඩලයේ අනුමැතිය සහිතව ප්‍රදේශීය ලේකම් වෙත තොරතුරු ඉදිරිපත් කර ඇත. | දේපලවල හිමිකාරීත්වය ආයතනය වෙත පවරා ගැනීම කළ යුතුය. |

### 3.2 මානව සම්පත් කළමනාකරණය

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| අධ්‍යක්ෂ ජනරාල්, පුස්තකාලයාධිපති හා සන්නිවේදන කළමණාකරු යන තනතුරු සඳහා රාජ්‍ය සේවයෙන් විශ්‍රාම ගිය නිලධාරීන් නැවත සේවයේ පිහිටුවා තිබුණද ඒ සඳහා අමාත්‍ය මණ්ඩල අනුමැතිය ලබාගෙන නොතිබුණි. | ඉදිරියේදී අදාළ විධි විධාන අනුව කටයුතු කිරීමට සටහන් කර ගත් බව. | විධිමත් අනුමැතිය සහිතව බඳවාගැනීම් කළ යුතුය. |